www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2009 වසර තුල දී එක්සත් ජනපද දුරස්ථ පාලක මිසයිල පාකිස්තාන වැසියන් 700ක් සමූල ඝාතනය කරයි

**US drone missiles slaughtered 700 Pakistani civilians in 2009**

**2010 ජනවාරි 5**

**මේ** සතියේ ඉස්ලාමාබාද් නිලධාරීන් විසින් නිකුත් කරන ලද සංඛ්‍යාලේඛනවලට අනුව, වසරකට පෙර බැරැක් ඔබාමා බලයට පත් තැන් පටන් එක්සත් ජනපද දුරස්ථ පාලක මිසයිල ප්‍රහාර වලින් වල දමා ඇති පාකිස්තාන සිවිල් වැසියන්ගේ ප්‍රමානය 700කට අධිකය. දැන් වියරු ලෙස ඉදිරියට යන වොෂින්ටනයේ ඇෆ්පාක් යුද්ධය පුපුරායාමේ අර්ථය වනු ඇත්තේ 2010 වර්ෂය තුල තවත් දහස් ගනන් මිනිසුන්, ගැහැනුන් සහ ළමුන් සංහාරයට ලක් කිරීමයි.

මේ සඳහා පාකිස්තානයේ දෛනිකව පලවන ඩෝන් ඉංග්‍රීසි පුවත්පත මෙම බියකරු මරන ප්‍රමානය වාර්තා කලේ ඇෆ්ගනිස්ථාන දේශසීමාව ආසන්නයේ දුගී ගම්මානයකට එල්ලවූ නවතම හෙලිකොප්ටර් මිසයිල ප්‍රහාරයක් පලිබඳව වාර්තා කිරීමට අමතර වසයෙනි. මෙම මිසයිල ප්‍රහාරය පාකිස්තාන ගුරුවරයෙක් හා ඔහුගේ නව හැවිරිදි පුත්‍රයා ඔවුන්ගේ නිවසේ සුන්බුන් අතර මරා වලලා දැමීය. නම් සඳහන් නො කල එක්සත් ජනපද බුද්ධි අංශ නිලධාරීන් උපුටා දැක්වූ මාධ්‍ය වාර්තාවන්ට අනුව සටන්කාමීන් මෙම ගුරුවරයාගේ නිවස නිතර පරිහරනය කල බවට වූ වාර්තා නිසා එය ප්‍රිඩේටර් දුරස්ථ පාලක ප්‍රහාරයකට ඉලක්ක කරගනු ලැබ ඇත.

මේ වාර්තා සම්පාදනය කලේ කවුද? ඒවායේ හරිවැරදි බැලුවේ කෙසේ ද? ඔහුගේ පුත්‍රයා ගැන සඳහන් කිරීම පසෙක තිබියේවා මෙම ගුරුවරයා ''සටන්කාමීන්'' යයි චෝදිත අයගේ ක්‍රියාවන්ට සම්බන්ධ බවට කිසිදු සාක්ෂියක් තිබේ ද? එක්සත් ජනපද ආන්ඩුවෙන් හෝ මිනීමරුවෝ සහසමාගම වශයෙන් බුද්ධි අංශයේ කුප්‍රකට නාමය යලි යලි සනාථ කරමින්, මෙම ප්‍රහාරවලින් බහුතරයක් මෙහෙයවන සීඅයිඒ වෙතින් මේවාට පිලිතුරු නැත.

වොෂින්ටනය, සීඅයිඒ සහ පෙන්ටගනය තමන් කැමති තැනක දී නීතියට පිටස්තර ඝාතන සිදුකිරීමේ අසීමිත අයිතිය තමන්ට පවරාගෙන ඇත්තේ සාධිත සාක්ෂි තබා විස්තර කිරීමේ අවශ්‍යතාවයටවත් ඉඩක් නො තබා ය. බුෂ් පරිපාලනය යටතේ ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය යුද්ධය යන අපනාමයෙන් මුලපිරූ මෙම අපරාධකාරී භාවිතාව ඔබාමා යටතේ උත්සන්න කිරීම පමනක් සිදු වී ඇත

පසුගිය වසර තුල එක්සත් ජනපද නියමුවන් රහිත ගුවන් යානා බටහිර පාකිස්තානයේ ගෝත්‍රික ප්‍රදේශයන්ට 44වතාවක් මිසයිල ප්‍රහාර එල්ල කොට ඇති අතර එය බුෂ් පරිපාලනයේ අවසන් වසර තුල එල්ල කල ප්‍රහාර ගනනට වඩා දෙගුනයකටත් වැඩි ය. පාකිස්තාන ආන්ඩුවේ නිලධාරීන් විසින් සකස් කරන ලද ගනන් හිලවු උපුටා දක්වන ඩෝන් පුවත්පත වාර්තා කරන්නේ මෙම ප්‍රහාර යන්තම් ''අල්කයිඩා හා තලිබාන් නායකයන් 5දෙනකු'' පමනක් මරාදැමීමට සමර්ථ වූ බවයි. ඔවුන්ගේ ඊනියා අතිරේක හානියට අහිංසක සිවිල් වැසියන් 708කගේ ජීවිත ඇතුලත් ය. ''එක්සත් ජනපද යානා මගින් මරා දමන ලද සෑම අල්කයිඩා හා තලිබාන් ත්‍රස්තවාදියෙකුට ම අහිංසක පාකාස්තානුවන් 140කට දිවි දීමට සිදු වී ය'' යයි පුවත් පත වාර්තා කරයිඃ ''මරනීය මිසයිල ප්‍රහාර මගින් ඝාතනය කරන ලද අයගෙන් සියයට 90කට වැඩි ප්‍රමානයක් සිවිල් වැසියන් බව බලධාරීහු පවසති.''

මිසයිල ප්‍රහාර මාලාවේ අතිශය අවම සාර්ථකත්වයන්ගෙන් එකක් ලෙස පුවත් පත ලැයිස්තු ගත කරන්නේ පසුගිය වසරේ අගෝස්තු 5 වෙනි දින පාකිස්තාන තලිබාන් නායක බයිතුල්ලා මෙසූඩ් සහ ඔහුගේ බිරිඳ මරාදැමූ ප්‍රහාරය යි. කෙසේ වෙතත් විමර්ශනාත්මක වාර්තාකරුවකු වන ජේන් මේයර් පසුගිය ඔක්තෝබරයේ නිව් යෝකර් පුවත් පතේ සඳහන් කල ආකාරයට ''සීඅයිඒ සංවිධානය ඔහුව මරා දැමීම සාර්ථක කරගැනීමට පෙර මිසයිල ප්‍රහාර 16ක් මාස 14ක්''වියදම් කොට තිබුනි. පූර්ව අසාර්ථක ප්‍රහාර සමස්ත කලාපයක් ත්‍රස්ත කරන අතරවාරයේ අහිංසක සිවිල් වැසියන් 321කට වැඩි ප්‍රමානයක් ඝාතනය කරන ලද බවට විශ්වාස කෙරේ.

ඩෝන් හි කථාව නිෂ්ප්‍රභ කරන තොරතුරු එක්සත් ජනපද ආන්ඩුවෙන් සැපයෙන්නේ නැත.

සීඅයිඒ සංවිධානය තම මිසයිල ව්‍යාපෘතිය "රහස්‍ය" එකක් ලෙස වර්ග කරන අතර එමගින් ඝාතනය කරන මිනිසුන්ගේ සංඛ්‍යා හෝ අනන්‍යතාව පිලිබඳ තොරතුරු සම්පාදනය නො කරයි. නම් නො කල රහස් තොරතුරු මූලාශ්‍ර (එමෙන් ම ඇෆ්ගනිස්ථානයේ සිටින මිලිටරි ප්‍රකාශකයින්) උපුටා දක්වන මාධ්‍ය පුරුද්දක් ලෙස වාර්තා කරන්නේ මිසයිල ප්‍රහාරවලින් ඝාතනයට ලක්වන සියල්ලන් ''සටන්කාමීන්'' බවයි. දුරස්ථ ගෝත්‍රික ගම්මානවලින් ගැහැනුන් සහ ලමුන්ගේ කුඩු පට්ටම්වී ගිය සිරුරු පිලිබඳ ඇසින් දුටු සාක්ෂි පැමිනිවිට පමනක් සත්‍ය කතාව වෙනස් බවට යෝජනා පලවේ.

"මිසයිල ප්‍රහාරවලින් බොහොමයක් එල්ල කරන ලද්දේ ඇෆ්ගනිස්ථානය තුල සිටින එක්සත් ජනපද-මෙහෙයුම්කාරක මිත්‍ර හමුදාවලට ඔත්තු සපයන පාකිස්තාන සහ ඇෆ්ගන් ගෝත්‍රිකයන්ගෙන් ලැබෙන මානව බුද්ධි තොරතුරු මත පදනම්ව''යි ඩෝන් තම ලිපියට එකතු කලේ ය.

පසුගිය සතියේ නැගෙනහිර ඇෆ්ගනිස්ථානයේ ඔපරේටිං බේස් චැප්මන්හි දී සීඅයිඒ නිලධාරීන් හත් දෙනෙකු සහ ජෝර්දාන රහස් තොරතුරු ඒජනතයෙකු ඝාතනය කරමින් එල්ලවූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය එවැනි රහස් තොරතුරුවල විශ්වාසවන්ත භාවය පිලිබඳ එක් දර්ශකයක් සැපයී ය.

එෆ්ඕබී චැප්මන්හි ක්‍රියාකාරිකයෝ ප්‍රිඩේටර් මිසයිල සඳහා ඉලක්ක තෝරාගැනීමේ ඍජුව ම නිරත වූහ. ඔවුන්ගේ මූලික "වත්කමක්" ලෙස සැලකුනු බෝම්බකරුවා, ක්‍රියාන්විතයේ සීඅයිඒ ප්‍රධානියා ද ඇතුලත් ක්‍රියාකාරිකයන්ව මරාදැමීම සඳහා හමුවකට කැඳවීමට පෙරතුව වසරකටත් වඩා වැඩි කාලයක් තිස්සේ ව්‍යාජ තොරතුරු ලබා දුන්නේ ය. පාකිස්තානය තුල මිසයිල ව්‍යාපාරය වනාහි එක්සත් ජනපදය සැබවින් ම යුද්ධයක යෙදී නොසිටින රටක මිනිසුන්ට එරෙහිව ක්‍රියාත්මක "ඉලක්ක ගත ඝාතන" සහ මහජන සංහාරක ක්‍රියාවලියක දිග්ගැස්සුනු අභ්‍යාසයකි. මධ්‍යම ආසියාව සහ පර්සියානු ගල්ෆ් කලාපය තුල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මිලිටරි ප්‍රහාරක ව්‍යාපාරයේ අපරාධකාරී සහ ප්‍රතිගාමී ස්වභාවය පිලිබඳ සියල්ල එය විසින් දෘෂ්ටාන්ත කොට දක්වයි.

සීඅයිඒ නිලධාරීහු සහ මිලිටරි කොන්ත්‍රාත්කරුවෝ (එනම් ඉතා හොඳින් ගෙවනු ලබන කුලීකාරයෝ) වර්ජිනියාහි ලැන්ග්ලි නගරයේ වීඩියෝ තිරයක් ඉදිරිපිට වාඩි වී සිටිමින් පාකිස්තානු ගම්වැසියන්ගේ නිවෙස්වලට මිසයිල යැවීමට විනෝද ක්‍රීඩාමය දඬු පාවිච්චි කරති. සැතපුම් 7,000කට ඈතින් සිටින මිනිසුන්, ගැහැනුන් සහ ලමුන් ඝාතනය කරමින් දවසක් ගතකිරීමෙන් පසු ඔවුහු ඔවුන්ගේ මෝටර් රථවලට නැගී තමන්ගේ කුටුම්භ වෙත රාත්‍රී ආහාර සඳහා පිටව යති.

සීඅයිඒ සංවිධානයේ රහස්‍ය භාවය ද ඉලක්ක ගත ගෝත්‍රික ප්‍රදේශවල කටයුතු කිරීමෙන් පාකිස්තාන තන්ත්‍රය මාධ්‍ය වලක්වා තිබීම ද අතරේ මෙම ප්‍රහාරවලින් සිදුවන මිනිස් සංහාරය ඇමරිකානු ජනතාවගෙන් බෙහෙවින් වසන් කරනු ලැබ ඇත. මහජනතාව හමුවේ එය සාධාරනීකරනය කරනු ලබන්නේ ත්‍රස්තවාදය පරාජය කිරීමේ නාමයෙනි.

ඩෝන් විසින් සම්පාදනය කරනු ලබන බියකරු සමීකරනය -එනම් ප්‍රිඩේටර් ප්‍රහාර මගින් ඝාතනය කරන ලද සෑම "ත්‍රස්තවාදියෙකු"ට ම සිවිල් වැසියන් 140ක් ඝාතන වී ය යන්න- සැලකීමේ දී මෙය පැහැදිලිව ම ව්‍යාජෝක්තියකි. පසුගිය වසරේ මිසයිල ප්‍රහාර 44 මගින් ත්‍රස්තවාදය මර්දනය කිරීමට කල දෙයක් නැත. ඒ වෙනුවට එමගින් කර ඇත්තේ තම පවුල්, මිතුරන් සහ අසල්වැසියන් ඝාතනය කිරීම නිසා පෙරලා එක්සත් ජනපදයට ප්‍රහාර එල්ල කල යුතු යයි සිතන සිය දහස් ගනනක් නොහොත් දස දහස් ගනනක් ජනයා නිර්මානය කිරීම යි.

නියමු රහිත ගුවන් යානා මගින් එල්ල කරනු ලබන ප්‍රහාර වනාහි ත්‍රස්තවාදය මර්දනය කිරීම හෝ එක්සත් ජනපද වැසියන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීමට වඩා බෙහෙවින් වෙනස් අරමුනු වලින් මෙහෙයවෙන ඇමරිකානු මිලිටරිවාදයේ දෙදෙරා යාමක කොටසකි. එය ධාවනය කරනු ලැබුවේ එක්සත් ජනපදය තුල ධනවාදයේ අර්බුදය මගින් හා ඇමරිකානු පාලක ප්‍රභූව ප්‍රථමවත් ප්‍රමුඛවත් බලශක්ති මූලාශ්‍රවලින් පොහොසත් සහ මූලෝපායිකව තීරනාත්මක පර්සියන් ගල්ෆ් සහ මධ්‍යම ආසියානු කලාපය මත තම ආධිපත්‍යය පැටවීම දරන්නා වූ මිලිටරිමය උපායන් මඟිනි.

පසුගිය වසර පුරා ඔබාමාගේ නියෝග මත එල්ල කරන ලද ප්‍රහාරවලින් මියගිය 700කට වැඩි දෙනා හුදෙක් මුලපිරීම පමනකි. ඔහුගේ පරිපාලනයේ මිලිටරිමය "උත්සන්නියේ" කොටසක් ලෙස එක්සත් ජනපද-මෙහෙයුම්කාරක වාඩිලාගැනීමට එරෙහිව සටන් කරන ඇෆ්ගන්වරුන්ට ලබදෙන සහයෝගය තලා දමන ලෙස එක්සත් ජනපද නිලධාරීහු පාකිස්තාන ආන්ඩුවට බලකොට ඇත්තාහ. ඉස්ලාමාබාදය තීරනාත්මක පියවරක් නො ගතහොත් තලිබාන් නායකයන් රැකවරනය ලබන්නේ යැයි විශ්වාස කෙරෙන මිලියනයකට වැඩි දෙනා ජීවත්වන ක්වේටා නගරයට එල්ල විය හැකි මිසයිල ප්‍රහාරයක තර්ජනය ද සමග එක්සත් ජනපදය ඒකපාර්ශවීයව ක්‍රියාත්මක වනු ඇතැයි වොෂින්ටනය තර්ජනය කොට ඇත.

පාකිස්තානය තුල සිදුවන සෑම එක්සත් ජනපද ක්‍රියාන්විත තීව්‍ර වීමක් ම වොෂින්ටනයේ අපරාධවලට හවුල්කාරී ආන්ඩුවට තවදුර වලකපන්නේ න්‍යෂ්ටිකව සන්නද්ධ රටක් තුල සිවිල් යුද්ධයකට ද සමස්ත කලාපය අස්ථාවර කිරීමට ද තර්ජනය කරමිනි.

මිලිටරි-බුද්ධි අංශ කල්ලිය, නියමු රහිත යානා ප්‍රහාර වැලඳගෙන ඇත්තේ බහුතර ඇමරිකානු ජනතාව විසින් විරුද්ධ වන යුදධයක් දියත් කිරීමේ ගැටලුවට තාක්ෂනික පිලිතුරක් ලෙස ය. එම ප්‍රහාර මගින් ක්ෂනික එක්සත් ජනපද තුවාලකරුවන් ඇති නො වන අතර එමගින් ඇති කරන මානව විනාශය බොහෝ කොට සඟවනු ලැබේ.

එහෙත් එමගින් නවත්වනු නො ලැබුව හොත් එක්සත් ජනපදය තුලත් ලෝක පරිමානවත් කම්කරු පන්තියට දැවැන්ත මිලක් ගෙවීමට සිදුවනු ඇත්තා වූ පුලුල් පරිමාන මිලිටරි ගින්නක බිජවට ඔවුන් විසින් වපුරමින් සිටිති.

බිල් වෑන් ඕකන්

© www.wsws.org